

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ

ඊශ්‍රායල රාජ්‍යයේ ආණ්ඩුව

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව

අතර ගිවිසුමයි

මෙහි මීත්මතු පාර්ශව ලෙස හැඳින්වෙන ඊශ්‍රායල රාජ්‍යයේ ආණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව, දෙරටේ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩපිළිවෙළවල් වලට අනුකූලව, දෙරට අතර ආහාර හා කෘෂිකාර්මික ක්ෂේත්‍රවල සහයෝගීතාවයක් ඇති කර ගැනීමේ වැදගත්කම හඳුනාගනිමින්, දෙරට අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාවය වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පුළුල් කිරීම සඳහා,

පහත පරිදි ගිවිස ගනිති.

1 වැනි වගන්තිය

පාර්ශවයන් පහත සඳහන් පරිදි ගිවිස ගනී.

(අ) කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාතික සහ ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වය ලබාදීම පිණිස සහයෝගීතාවෙන් යුතුව කටයුතු කිරීමට

(ආ) දෙරටේම කෘෂිකාර්මික අංශවල යහපත උදෙසා, තාක්ෂණික සහ විද්‍යාත්මක දැනුම හුවමාරුව, මෙන්ම කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාවට නැංවීම පිළිබඳ දත්ත හා අත්දැකීම් හුවමාරුව ප්‍රවර්ධනය කිරීමට

(ඇ) දෙරටේ අදාල සංවිධාන, සංගම් සහ පෞද්ගලික අංශ අතර සහයෝගීතාවය වර්ධනය කිරීමට අනුබල දැක්වීමට

2 වැනි වගන්තිය

දෙවෙනම, කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ සාපේක්ෂ වශයෙන් ඇති වාසිදායක තත්ත්ව සළකා බැලීමෙන් පසු පිළිවෙලින් පහත දැක්වෙන අංශවල සහයෝගීතාව ඇති කර ගැනීමට යෝජනා කරනු ලැබේ.

(අ) ශක්‍යතා වර්ධනය සහ දැනුම සම්ප්‍රේෂණය කිරීම.

(ආ) තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීම.

(ඇ) ව්‍යාප්ති හා පර්යේෂණ සහ සංවර්ධන පද්ධති (R ස D Systems) වැඩි දියුණු කිරීම.

(ඈ) විද්‍යාත්මක සහ කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම.

(ඉ) පොදු - පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ප්‍රවර්ධනය කිරීම.

(ඊ) කෘෂිකාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය සහ ප්‍රාමාණික ඉහළ යාම වැඩි දියුණු කිරීම (උදා : පශු සම්පත් සහ උද්‍යාන වගා අංශයන් වෙත වැඩි අවධානයක් යොමු කරමින්).

(උ) ජල කළමනාකරණය සහ නවීන වාරිමාර්ග තාක්ෂණය.

(ඌ) විකල්ප ආර්ථික කටයුතු සමඟ ග්‍රාමීය සංවර්ධනය.

(එ) ඉඩම් සංරක්ෂණය සහ නිවැරදි කෘෂිකාර්මික පුරුදු.

3 වැනි වගන්තිය

පාර්ශව, තම තමාගේ රටෙහි කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීතිය, සංඛ්‍යාලේඛන සහ අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන වෙනත් කරුණු හුවමාරු කිරීම තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳ දැනුම බෙදා හදා ගත යුතුවේ.

4 වැනි වගන්තිය

කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් සිදු කරනු ලබන ද්විපාර්ශ්වික වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෙම පාර්ශව ශාක සතිපාරක්ෂක කටයුතු, පැළෑටි ආරක්ෂා කර ගැනීම සහ සත්ත්ව රෝග පිළිබඳ ගැටළු ආදිය සම්බන්ධයෙන් තම තමන්ගේ රෙගුලාසි පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා දිරිමත් කල යුතු වේ.

5 වැනි වගන්තිය

ගොවිතැන් කිරීම සහ ඉහත සඳහන් මාතෘකා සම්බන්ධයෙන් සිම්පෝසියම් සහ සම්මන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය එක්ව කටයුතු කල යුතුය.

6 වැනි වගන්තිය

අදාළ කටයුතු සඳහා මූල්‍ය සම්පාදනය අන්‍යෝන්‍ය එකඟතාවය මත සිදු කල යුතුවේ.

7 වැනි වගන්තිය

විශේෂඥයන් සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම මෙම ගිවිසුම ක්‍රියාවට නැඟීමෙහි අංගයක් විය යුතුය.

8 වැනි වගන්තිය

දෙපාර්ශවයෙහි අන්‍යෝන්‍ය එකඟතාවය මත ඕනෑම අවස්ථාවකදී මෙම ගිවිසුම සංශෝධනය කල හැකිවේ. එම සංශෝධනයන් 9 වැනි වගන්තියෙන් දක්වා ඇති ක්‍රියාපටිපාටීන්ට අනුවම බලාත්මක විය යුතුවේ.

-/1/c

9 වැනි වගන්තිය

මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා වන එක් එක් පාර්ශවයේ අභ්‍යන්තර නෛතික අවශ්‍යතා සපුරා ඇති බව එකිනෙක පාර්ශව වෙත යනාථ කරන රාජ්‍ය තාන්ත්‍රික සටහන් දෙපාර්ශවය විසින් හුවමාරු කර අවසන් කළ දින සිට මෙම ගිවිසුම බලාත්මක වන්නේය.

මෙම ගිවිසුම අවුරුදු පහක (5) කාලසීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතුය. ඉන්පසුව, පස් (5) අවුරුදු කාලසීමාවලින් ස්වයංසිද්ධව දීර්ඝ වනවා ඇත. එසකුදු වුවත්, ගිවිසුම අවලංගු කිරීම පිළිබඳ ලිඛිත දැනුම් දීමක් පාර්ශව දෙකෙන් කුමන හෝ පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත රාජ්‍ය තාන්ත්‍රික මාර්ග මඟින් යැවීමෙන් ඕනෑම අවස්ථාවක එය අවලංගු කළ හැකිය. එවැනි අවස්ථාවකදී ගිවිසුම අවසන් කිරීමේ දැනුම් දීම යැවූ දින සිට මාස හයක කාලයක් ඉකුත් වීමෙන් පසුව මෙම ගිවිසුම අවසන් වෙනවා ඇත.

වෙනත් ආකාරයකින් ගිවිසගෙන ඇත්නම් මිස එසේ නොමැතිනම් මෙම ගිවිසුම අවසන් කිරීම, එසේ කිරීමට පෙර ආරම්භ කරන ලද කිසිදු වැඩසටහනක් කෙරෙහි බලනොපෑ යුතුය.

5771 ..... වන දිනට අනුරූප වන, 2011 ..... වන දින හිබෘ, සිංහල හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්, සෑම පිටපතක්ම සමානව සත්‍යවත් වන ආකාරයෙන් පිටපත් දෙකක් සහිතව සකසා අත්සන් කරන ලදි. අර්ථාවබෝධ කිරීමේදී යම් අපසාරිතාවක් ඇතිවුවහොත් ඉංග්‍රීසි පිටපත වලංගුව පවතිනු ඇත.

.....

ඊශ්‍රායල් රාජ්‍යයේ ආණ්ඩුව

වෙනුවට

.....

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ

ආණ්ඩුව වෙනුවට